# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2010
### 2012 ජනවාරි / පෙබරවාරි

### මානවශාස්ත්‍ර පීඨය

### ක්‍රිස්තියානි සංස්කෘතිය - CHCU- E2015

### ක්‍රිස්තියානි ශාසනයේ ඉතිහාසය

**එක් කොටසකින් ප්‍රශ්න දෙකක් (02) ඇතුලත් වනසේ ප්‍රශ්න <u>පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි**      **කාලය : පැය 03 යි**

---

## <u>පළමුවන කොටස</u>

01. ක්‍රිස්තියානි ධර්මයේ ආරම්භක සමයේ සිට සභාව විවිධාකාර පීඩනවලට ලක්විය. එහෙත් එම පීඩා මධ්‍යයේ සභාව වඩ වඩාත් ශක්තිමත් වෙමින් වර්ධනය විය. පළමු ශතවර්ෂ තුන තුළ ජෙරුසලමේ සහ පොදුවේ රෝම අධිරාජ්‍යයේ ව්‍යාප්ත වූ සභාව නිදසුන් කොට ගනිමින් ඉහත කී ප්‍රකාශනයේ සත්‍යතාවය සාකච්ඡා කරන්න.

02. රෝම අධිරාජ්‍යයේ පෙරදිග පෙදෙස වෙත එල්ල වූ මුස්ලිම් ආක්‍රමණත් බටහිර යුරෝපීය පෙදෙස වෙත එල්ල වූ ගෝත්‍රික ආක්‍රමණත් සභාව වෙත බලපෑ ආකාරය විස්තර කරන්න.

03. තාපස ව්‍යාපාරය ගැන කෙටියෙන් සඳහන් කර තාපස ව්‍යාපාරය මගින් සභාවේ වර්ධනය සඳහා දක් වූ දායකත්වය පැහැදිළි කරන්න.

04. මාටින් ලූතර්තුමන්ගේ රෙපරමාදු ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ගැන කෙටියෙන් සඳහන් කර එතුමාගේ ප්‍රතිසංස්කරණ ක්‍රමානුකූලව සභා නවෝදයක් ගෙන ඒමට හේතුවූ ආකාරය විස්තර කරන්න.

05. පළමු හා දෙවන වතිකාන මන්ත්‍රණ සභාවල මූලික සැකැස්මේ වෙනස පැහැදිළි කොට, දෙවන වතිකාන මන්ත්‍රණ සභාව නූතන ලෝකය වෙත සභාව විවෘත කරලීමට හේතුවූ ආකාරය පැහැදිළි කරන්න.

## <u>දෙවන කොටස</u>

06. "පෘතුගීසීන් ලංකාවට පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානීන් සිටිය බවට සාක්ෂි හමුවී තිබේ." ඉහත කියමන පිළිබඳව නිදසුන් සහිතව කරුණු ඉදිරිපත් කරන්න.

07. පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණි අවධියේ ශ්‍රී ලංකාවේ පැවති සමාජීය සහ දේශපාලන තත්ත්වය කෙටියෙන් විස්තර කොට එම තත්ත්වය පෘතුගීසීන්ට ශ්‍රී ලංකාවේ තම බලය තහවුරු කර ගැනීමටත්, ධර්ම ප්‍රචාරයටත් උපයෝගී වූ ආකාරය විස්තර කරන්න.

08. පෘතුගීසි සමයේ ධර්මදූතවරුන්ගේ සහ ජුසේවාස්තුමන් ඇතුළු ඔරතෝරියන් ධර්මදූතවරුන්ගේ ධර්මදූත ක්‍රියාවලිය පිළිබඳව සංසන්දනාත්මකව කරුණු දක්වන්න.

09. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමයේ දී එම පාලකයන් රටේ පැවති විවිධ ආගම් පිළිබඳව දරූ ආකල්පයත්, ඒවා විෂයයෙහි ක්‍රියාකළ ආකාරයත් පැහැදිළි කරන්න.

10. නිදහස ලැබීමෙන් අනතුරුව ක්‍රිස්තියානින් මුහුණ පෑ විවිධ ගැටලු හා එම ගැටලු මධ්‍යයේ ක්‍රිස්තියානින් රට තුළ ක්‍රියාත්මක වූ ආකාරයත් විස්තර කරන්න.

****************************